**ශීර්ෂය 193 - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 193 - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූනි 28 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2023 දෙසැම්බර් 31 දිනට කම්කරු අංශයේ, විදේශ රැකියා අංශයේ හා ජාතික එලදායිතා ලේකම් කාර්යාලයේ සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් රු.1,746,710 ක ශේෂයක් අයවිය යුතු අතර ඉන් වර්ෂ වර්ෂ 5 ත් 10 ත් අතර රු.393,914 ක් ද වර්ෂ 10 ත් 20 ත් අතර රු.138,501 ක්ද ශේෂයන් පවතින බව නිරීක්ෂණය විය. | ප්‍රාදේශීය ලේකම්වරු, ග්‍රාම නිලධාරීන් මගින් දැනුම් දී ණය අයකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, ඇතැම්ශේෂ අය වෙමින් පවතී. | ණය ශේෂ අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | කම්කරු අංශයේ සේවයේ යෙදී සිටියදී 2022 දෙසැම්බර් මස 29 වන දින මියගිය නිලධාරියෙකුගේ රු.230,300 ක් වූ ආපදා ණය ශේෂය 2023 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. | මෙම රු.230,300 ක් වූ ආපදා ණය ශේෂය පිළිබඳව පවුලේ ඥාතීන් දැනුවත් කිරීමෙන් පසු නිරවුල් කිරීමට කටයුතු කරන බව වාචිකව දන්වා ඇතත් මෙතෙක් නිරවුල් කිරීමට කටයුතු කර නොමැත. කෙසේ වෙතත් ආයතන සංග්‍රහයට xxiv පරිච්ඡේදයේ 4.5 වගන්තිය අනුව ඇපකරුවන් මඟින් අයකර ගැනීම සඳහා ඇපකරුවන් වෙත දැනුවත් කිරීම මේ වන විට සිදු කර ඇති බැවින් අය කර ගැනීමට කටයුතු කරමි. | ණය ශේෂ අයකිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූලධන වැය විෂයන් 4 ක් සඳහා සලසා තිබුණු රු.16,400,000 ක ප්‍රතිපාදනයන්ගේ සියයට 100 ක ඉතිරිවීම් නිරීක්ෂණය විය. මේ අතර ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ | 17 වන මහලේ අභ්‍යන්තර කාමර වෙන්කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කරනු ලැබුවද අවම පිරිවැයක් යටතේ කාර්යය ඉටුකර ගැනීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි වූ බව. | සලසාගත් ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිතා කල යුතුය. |

කාර්යාලය සැකසීමේ කාර්යය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන රු.5,000,000 ක් සහ 17 වන මහලේ අභ්‍යන්තර කාමර වෙන්කිරීම සඳහා සලසාගත් ප්‍රතිපාදන රු.10,000,000 ක් පැවතුණි.

**2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | මු.රෙ.104 (4) | 1,665,178 | අලාභයක් සිදු වූ දින සිට / එය අනාවරණය වූ දින සිට මාස 3 ක් ඇතුලත අලාභය සම්බන්ධ පූර්ණ පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවද, ජාතික එළදායිතා ලේකම් කාර්යාලයේ වැටුප් සැකසීමේදී සිදු වී තිබූ රු.5,133,519 ක මූල්‍ය වංචාව සිදු වී වසර 2 කට අධික කාලයක් ගතවී තිබුණද ඒ සමබන්ධයෙන් කටයුතු කර නොතිබුණු අතර තවදුරටත් රු.1,665,178 ක මුදලක් අය වීමට තිබුණි. | ඉහත මූල්‍ය වංචාවට අදාලව මු.රෙ.104 අනුව ප්‍රාරම්භක වාර්තාවක් එවකට අධ්‍යක්ෂ විසින් පත් කරන ලද කමිටුවක් විසින් සකස් කරන ලද අතර එම වාර්තාව අදාළ කටයුතු සඳහා ලැබී ඇති බව හා මුල්‍ය වංචාවට අදාළව අය කර ගැනීමේ කටයුතු අධිකරණය මඟින් ලබාදෙන නියෝග අනුව සිදු කරනු ලබන බව. | අලාභයන් සම්බන්ධව ආයතන පරීක්ෂණ මු.රෙ. ප්‍රකාරව සිදුකල යුතුය. |
| (ආ) | මු.රෙ. 610 සහ 1994 අප්‍රේල් 20 දිනැති 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ | | ආසියානු එළදායීතා සංවිධානයේ ආධාර යටතේ දිස්ත්‍රික්ක තුනක කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘති ඇති කිරීම සඳහා 2021 වර්ෂයේදී ඇ.ඩො.40,000 ක ප්‍රතිපාදන අනුමත කොට තිබුණි. මෙකී ආධාර මුදලින් ඇ.ඩො.28,000 ක් (රු.5,699,900) චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල නොවන ලෙස එළදායීතා ලේකම් කාර්යාලයේ බැංකු ගිණුම් රඳවාගෙන තිබුණි. | මේ යටතේ මෙතෙක් කල් සිදු කරන ලද ව්‍යාපෘති සඳහා සියලු ආධාර මුදල් ආසියානු එළදායිතා සංවිධානය මඟින් ජාතික එළදායිතා ලේකම් කාර්යාලයේ බැංකු ගිණුම් වෙත යොමු කර තිබුණි. කෙසේ වෙතත් විගණනයේ දී පෙන්වා දුන් පරිදි ව්‍යාපෘති සඳහා ලැබෙන විදේශාධාර මුදල්, මේ වන විට මහාභාණ්ඩාගාරය හරහා ලබා ගැනීම සඳහා අදාළ වැය ශීර්ෂ නිර්මාණය කර ගනිමින් ජාතික එළදායිතා ලේකම් කාර්යාලය වෙත ලබා ගැනීමට කටයුතු සිදු කර ඇති බව. | විදේශාධාර සම්බන්ධව මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් ලෙස දක්වා ඇති අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල විෂයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම ඇගයීම යන කාර්යයන් හා සේවක අර්ථසාධක අරමුදල පරිපාලනය කිරීම හා කාර්යභාරයන් ඉටු කිරීමට ගන්නා ලද පියවරයන් ගෙන තිබුණද පහත සඳහන් කාර්යභාරයන් විධිමත් පරිදි අවසන්ව නොතිබුණි. | | |
| (i) | ශ්‍රී ලංකාවේ ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම. | රැකියා සඳහා විගමනය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී සැලැස්ම සඳහා 2023.09.12 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු අතර 2023.10.25 දින දියත් කරන ලදි. ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික මට්ටමේ අධීක්ෂණ යන්ත්‍රණය වන රැකියා සඳහා විගමනය පිළිබඳ ජාතික උපදේශක කාරක සභාව මේ විට පිහිටුවා ඇති අතර, අදාල පාර්ශ්වයෙන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් පවත්වා ඇත. | අරමුණු හා කාර්යභාරයන් ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ii) | පුද්ගලික අර්ථසාධක අරමුදල් පරිපාලනය සඳහා 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ වගන්ති හා රෙගුලාසි සංශෝධනය. | පනත සංශෝධනයට අවශ්‍ය කටයුතු නියාමනය කිරීමටත්, එමගින් ප්‍රතිපාදනයන් වැඩි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට කමිටුවක් පත් කර තිබේ. පනතේ වගන්ති හා රෙගුලාසි සංශෝධනයටත් නඩු පැවරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමටත් මෙමගින් බලාපොරොත්තු වන බව. | අරමුදල් පරිපාලනය සඳහා අවශ්‍ය නීතිරීති සම්පාදනය කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | විදේශ රැකියා නිමකර දිවයිනට පැමිණෙන පුද්ගලයින් සඳහා ව්‍යාපාර ආරම්භ කිරීමට විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | විදේශ රැකියාව නිම කර ශ්‍රී ලංකාවට පැමිණෙන විගමනික ශ්‍රමිකයන් සඳහා ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා බහු කාර්ය ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දී ඇත. විදේශ ගත වීමට නියමිත විශේෂ අවධානය යොමු විය යුතු හඳුනා ගත් පවුල් ඒකක සඳහා සංවර්ධන සැලසුම් සකස් කරනු ලැබේ. ජාත්‍යන්තර සංක්‍රමණික සංවිධානය (IOM) හා හෙල්විටාස් ශ්‍රී ලංකා ආයතනය සංවිධානයෙන් අප අමාත්‍යාංශය සම්බන්ධීකරණයෙන් දකුණු පළාතේ විගමනික සේවකයින් නැවත සමාජය ගත කිරීමට දායකත්වය දක්වන ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනය හා මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ පුහුණු වැඩසටහනක්, නියමු වැඩසටහනක් ලෙස දකුණු පළාතේ විගමනික ශ්‍රමිකයන් 29 දෙදෙනෙකු සඳහා ව්‍යාපාර සැලසුම් සකස් කර දෙන ලද බව. | විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතුය. |
| (iv) | 1985 අංක 21 දරන විදේශ රැකියා නියුක්ති කාර්යාංශ පනත සංශෝධනය. | පනත සංශෝධනය සඳහා මුල්වරට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලද්දේ 2023.04.24 දින දීය. මේ වන විට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් මූලික කෙටුම්පත සකස්කර අවසන් ව ඇති අතර එකී මූලික කෙටුම්පත වරින්වර සංශෝධනය කිරීමෙන් පසු අවසන් වරට 2024.05.14 දින ද සංශෝධන පිළිබඳ සාකච්ඡාවක් පවත්වන ලදි. අවසන් කෙටුම්පතට නීතිපති නිශ්කාශන වාර්තාව ලබාදීමෙන් පසුව නැවත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කළහැක. | කාලීන අවශ්‍යතා පරිදි අණපනත් සංශෝධනය කල යුතුය. |
| (v) | වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි කම්කරු නීති ප්‍රතිසංස්කරණයන් සිදුකිරීම. (Unified Labour Law Reforms) | වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි කම්කරු නීති ප්‍රතිසංස්කරණය සඳහා මෙම අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් වෘත්තීය සමිති, හාම්පුතුන් ඇතුලු උනන්දුවක් දක්වන පාර්ශවයන් අතර සාකච්ඡා වාර 7ක් පවත්වා අදහස් ලබාගෙන දැනට ක්‍රියාත්මක පනත් 13 ක් සංශෝධනය කිරීමට හා වර්තමාන වැඩ ලොවට | අවශ්‍ය සංශෝධනයන් සිදුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ගැලපෙන සේ අලුතින් ඇතුලත් වියයුතු කරුණු ද සහිතව සේවානියුක්ති පනතක් සකස් කිරීමට 2023.08.07 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. කමිටුවක් මගින් සකස් කරන ලද මූලික කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක්වෙමින් පවතී. අවසන් කෙටුම්පත ලද විගස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කළහැකි බව. | |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදේශ රැකියා අංශයේ දිවයින පුරා සංවර්ධන නිලධාරීන් විසින් "ශ්‍රමික සුරැකුම" වැඩසටහන යටතේ ශ්‍රමිකයන්ගේ අභිමතය පරිදි ලියාපදිංචි කිරීමක් සිදුකරන නමුත්, මෙම වැඩසටහන යටතේ ලියාපදිංචි ශ්‍රමික පවුල් වෙත ලැබෙන ප්‍රතිලාභයන් කවරේද යන්න තහවුරු නොවීය. | මෙම වැඩසටහන යටතේ ලියාපදිංචි ශ්‍රමික පවුල් වෙනුවෙන් අවශ්‍යතාවය පරිදි සංවර්ධන සැලසුම් සහ රැකවරණ සැලසුම් සකස් කර සංවර්ධන නිලධාරින් විිසින් සිදු කරයි. සංවර්ධන සැලසුම් - විදෙස්ගත ශ්‍රමිකයාගේ විදේශගත වීමේ අරමුණ අනුව සකස් කර ගැනීමට අවශ්‍යය සහාය ලබා දෙන අතර එය ක්‍රියාත්මක විම පිළිබඳව පසුවිපරම් කිරිමක් සිදු කෙරේ.<br>රැකවරණ සැලසුම් - රැකියා සඳහා විදේශගත වීමේදි, වයස අවු.2 – 18 අතර අවිවාහක දරුවන් සිටින කාන්තාවන් විසින් බාලවයස්කාර දරුවන්ගේ රැකවරණය සඳහා සුදුසු වැඩපිළිවෙලක් ඉදිරිපත් කිරිම කළ යුතු වේ. මෙයට අමතරව සමාජීය අවධානමකට ලක් විය හැකි දරුවන් එම අවධානමෙන් මුදවා ගැනිම සඳහා රැකවරණ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරිම සිදු කරන බව. | ශ්‍රමික සුරැකුම වැඩසටහන විධිමත් හා ඵලදායක ලෙස සිදුකල යුතුය. |
| (ආ) | 1934 අංක 19 දරන කම්කරු වන්දි ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව ආපදාවකට හෝ මරණයට පත්වන සේවකයෙකු වෙනුවෙන් කම්කරු වන්දි අධිකරණයේදී නඩු විභාග කිරීමේදී සිවිල් නඩු විධිවිධාන සංග්‍රහය, අපරාධ නඩු විධිවිධාන | කම්කරු වන්දි ආඥා පනතට අනුව සේවයේ යෙදී සිටියදී සිදුවන අනතුරට හෝ වෘත්තීය රෝගාබාධයක දී වන්දි පනත අනුව ගෙවිය යුතු වන්දි මුදල ගෙවීමට සේවා යෝජක එකඟ වන්නේ නම් නොපමාව අයකර දීමට හැකි වේ. වග උත්තරකරු එකඟ නොවන | ආපදාවන්ට ලක්වූ කම්කරුවන් වෙත වන්දි ගෙවීමේ ක්‍රියාවලිය විධිමත් හා කාර්යක්ෂම විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සංග්‍රහය හා සාක්ෂි ආඥා පනත අදාල කරගත යුතු බැවින්ද දෙපාර්ශවයටම සාධාරණ හා යුක්ති සහගත අවස්ථාවන් ලබාදිය යුතු බැවින්ද වන්දි ලබාදීමේ ක්‍රියාවලිය ප්‍රමාද වී ඇති බව අනාවරණය විය. 2023 වර්ෂයේ විගණනය වෙත ඉදිරිපත් කල ගොනු 52 ට අදාල වූ තොරතුරු අනුව වසර 4 -12 දක්වා කාලයක් පුරාවට නඩු වාර 20 – 43 දක්වා වාර ගණනක් කැඳවා තිබූ අවස්ථාවන් නිරීක්ෂණය වූ අතර, මේ අතර මාරක අනතුරුවලට අදාල ගොනු 08 ක්ද පැවතුණද, ඒ සම්බන්ධ ක්‍රියාවලි අවසන් කර නොතිබුණි. | අවස්ථාවන්හ් දී අධිකරණ ක්‍රියා මාර්ග ගැනීමට සිදු වීමෙන් ප්‍රමාදයන් සිදු වේ. | |
| (ඇ) | රැකියාවේ යෙදී සිටියදී අගතියටපත් පාර්ශවය සඳහා හිමිවිය යුතු බවට වන්දි උසාවියෙන් තීරණය වුවද අදාල නියෝගය අනුව සේවායෝජක වන්දි මුදල් නොගෙවීම නිසා 2023 දෙසැම්බර් 31 දිනය වන විට නඩු 54 ක් මගින් සේවකයන් වෙත නොගෙවූ වන්දි මුදල් රු.12,344,117 ක් විය. මේ අතර වරෙන්තු නිකුත් කර වසර 10 ක් ඉක්මවූ නඩු 11 ක්ද, වසර 5 – 10 අතර නඩු 22 ක් හා වසර 1 – 4 අතර නඩු 11 ක්ද විය. | කම්කරු වන්දි උසාවි නියෝගය මත වන්දි මුදල් නොගෙවන අවස්ථාවන්හි දී වගඋත්තරකරුගේ දේපළ තහනම් කිරීම සඳහා කම්කරු වන්දි ආඥා පනත අනුව වරෙන්තුවක් නිකුත් කරනු ලබයි. එම වරෙන්තුව ක්‍රියාත්මක කිරීමේ බලතල ඇත්තේ වගඋත්තරකරු පදිංචි ප්‍රදේශයට අදාල මහේස්ත්‍රාත් අධිකරණයටය. කම්කරු වන්දි කොමසාරිස් මහේස්ත්‍රාත් බලතල අනුව කම්කරු වන්දි කොමසාරිස් දුන් තීන්දුව අදාල ප්‍රදේශයේ මහේස්ත්‍රාත් අධිකරණයක දුන් තීන්දුවක් ලෙස සලකා එය ක්‍රියාත්මක කිරීමට අදාල අධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් සිදු කරනු ලැබේ. ඒඅනුව වගඋත්තරකරුගේ දේපල පෙන්වා දීම, තහනම් කළ දේපල වෙන්දේසි කර වන්දි මුදල් අයකර ගැනීමේ ආදී කටයුතු සඳහා ඉල්ලුම්කාර පාර්ශවය ඉදිරිපත් වී මහේස්ත්‍රාත් උසාවියේ එම පිස්කල් නිලධාරීන්ට සහයෝගය ලබා දිය යුතු වේ. එම කටයුතු සඳහා ඉල්ලුම්කරුවන් ඉදිරිපත් නොවීම මත එම වරෙන්තු නඩු 54 කට අදාල වන්දි මුදල් මෙතෙක් අයකර ගැනීමට නොහැකි වී ඇත. | ආපදාවන්ට ලක්වූ කම්කරුවන් වෙත වන්දි ගෙවීමේ ක්‍රියාවලිය විධිමත් හා කාර්යක්ෂම විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රැකියාවේ යෙදී සිටියදී සිදුවන මාරක අනතුරු හේතුවෙන් මියයන සේවකයින්ගේ බාලවයස්කාර දරුවන්ට හිමි වන වන්දි මුදල් ඔවුගේ වයස් පූරණත්වයට පත්වන තෙක් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වන්දි කොමසාරිස් නමින් වූ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර වයස් පූර්ණත්වයට පත් වූ විට ඔවුන් වෙත නිදහස් කල යුතු වුවද, එලෙස වයස් පූර්ණත්වයට පත් වසර 40 ට ආසන්න වුවද බාල වයස්කාර ගිණුම් 110 ට අදාලව නිදහස් නොකල ස්ථාවර තැන්පතු වටිනාකම රු.638,296 ක් විය. එකී ගිණුම්වල 2021 ඔක්තෝම්බර් 28 දින ශේෂ තහවුරු කිරීම් අනුව පොළිය සමඟ වටිනාකම රු.3,383,043 ක් විය. 2021 වර්ෂයේදී වයස 18 සම්පූර්ණව නිදහස් නොවූ රු.235,000 ක්ද 2022 වර්ෂයේදී වයස 18 සම්පූර්ණව නිදහස් නොවූ ස්ථාවර තැන්පත් වටිනාකම රු.375,000 ක් විය. | මේ වන විට වයස් පූර්ණ තත්ත්වයට පත් වසර 40 ට ආසන්න බාල වයස්කරුවන් 109 ට අදාලව නිදහස් නොකළ ස්ථාවර තැන්පතු වටිනාකම රු. 614,996.00 ක් ද එම ගිණුම් වලට අදාලව පොළිය සමඟ වටිනාකම රු. 3,351,582.12 කි. 2021 වර්ෂයේ දී වයස 18 සම්පූර්ණ නිදහස් නොකළ ගොනු 02 ක් වන අතර එහි වටිනාකම රු. 200,000.00 කි. 2022 වර්ෂයේ දී වයස 18 සම්පූර්ණ නමුත් නිදහස් නොකළ ගොනු 02 කට අදාළ ස්ථාවර තැන්පතුවේ වටිනාකම රු.150,000.00 කි. මෙම වන්දි හිමි පුද්ගලයන්ගේ අනන්‍යතාවය ඔප්පු කර ගැනීමට ජාතික හැඳුනුම්පත් ඉදිරිපත් නොකිරීම, ලේඛන වල පවතින අඩුපාඩු, වර්තමාන ලිපිනයන් හඳුනා ගැනීමට නොහැකි වීම ආදී හේතු මත වන්දි මුදල් නිදහස් කිරීමට නොහැකිව ඇති බව. | වන්දි මුදල් නිදහස් කිරීමට අවශය පියවර ගත යුතුය. |
| (ඉ) | මාරක හා මාරක නොවන අනතුරුවලට අදාල කම්කරුවකු හෝ ඔහුගේ යැපෙන්නෙකු වන්දි මුදලක් ලබා ගැනීම පිණිස කම්කරු වන්දි කොමසාරිස් වෙත කරනු ලබන ඉල්ලීම්වලට සේවායෝජක විසින් සති 6 ක් තුල යහපත් ප්‍රතිචාර නොදැක්වූ විට නඩු මගට එළඹෙනු ලැබේ. එසේ වුවද ගොනු 35 ක් පරීක්ෂාවේදී සේවා දායකයා විසින් නඩු පැවරීමට ඉල්ලුම්කර පළමු නඩුවාරය කැඳවීමට මාස 11 සිට 115 දක්වා කාලය ගතවූ අවස්ථාවන් 11 ක් නිරීක්ෂණ විය. | උසාවිගත කිරීමේ දී නිවැරදිව වගඋත්තරකරු නම් කිරීම, තොරතුරු නිසි ලෙස වාර්තා කිරීම හා නිවැරදි වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කර තිබිය යුතුය. නැතහොත් වන්දි උසාවියේ දී හෝ අභියාචනායක දී ප්‍රතික්ෂේප වීමක් සිදුවිය හැක.එබැවින් උසාවිගත කිරීමට පෙර තොරතුරු නිවැරදි කර ගැනීමට කාලය ගත වී ඇත. | අගතියට පත් වූ කම්කරුවන් වෙත වන්දි ගෙවීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකල යුතුය. |

### 3.3 විදේශ ආධාර ව්‍යාපෘති

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආසියානු ඵලදායීතා සංවිධානය මගින් මහියංගනය හා තෙල්දෙණිය රෝහල් වෙත වෛද්‍ය උපකරණ බෙදාදීමේ ව්‍යාපෘතිය සඳහා ඇ.ඩො.90,000 ක අධාරයක් ප්‍රදානය කිරීමට එකඟ වී තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2021 වර්ෂයේදී අත්තිකාරම් වශයෙන් ඇ.ඩො.63,000 ක් ලැබී තිබුණු අතර, ව්‍යාපෘතිය අවසන් කිරීමට වෙනත් ව්‍යාපෘතියක් සඳහා ලැබුණු (පොහොර ව්‍යාපෘතිය) ඇ.ඩො.27,000 ක් වැයකර තිබුණි. වෛද්‍ය උපකරණ බෙදාදීමේ ව්‍යාපෘතිය 2023 අප්‍රේල් අවසන් වුවද මුදල් ප්‍රතිපූර්ණය කරගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද වීම නිසා මෙම මුදල ප්‍රතිපූර්ණය කරගැනීමට මෙතෙක් නොහැකි වී තිබුණි. අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු කඩිනම්ව සංවිධානය නොවීම නිසා මූලිකව සැලසුම් කල අයිතම දෙකක් මිලදී ගැනීමට නොහැකිව තිබූ අතර, විදේශ විනිමය අනුපාතිකය 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා අඛණ්ඩව පිරිහෙන තත්වයකදී අනුමත ආධාර මුදල ඉක්මවා ඇ.ඩො.2,221 ක වියදමක් දැරීමට සිදුව පැවතිණි. | ආසියානු ඵලදායිතා සංවිධානයේ ආධාර මත සිදු කරන ලද මහියංගනය හා තෙල්දෙණිය රෝහල් මත වෛද්‍ය උපකරණ බෙදා දීම සඳහා අනෙකුත් ව්‍යාපෘති මඟින් වැයකර තිබූ ඇ.ඩො.27,000 ක මුදල මේ වන විට ආසියානු ඵලදායිතා සංවිධානය මඟින් රාජ්‍ය ගිණුම් චක්‍රලේඛන ප්‍රකාරව මේ වන විට මහාභාණ්ඩාගාරය වෙත ප්‍රතිපූරණය කර ඇත. | අනුමත ප්‍රතිපාදන ඉක්මවා දැරූ වියදම් සම්බන්ධයෙන් කටයුතු කල යුතුය. |
| (ආ) | 2021 වර්ෂයේදී ආසියානු ඵලදායිතා සංවිධානය විසින් කාබනික පොහොර ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත ආධාර මුදල වූ ඇ.ඩො.40,000 න් ඇ.ඩො.28,000 ක් අත්තිකාරමක් ලෙස ලබාදී තිබුණු අතර, මෙම ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු 2022 දෙසැම්බර් දක්වා ප්‍රමාද වී | 2021 ජුනි මාසයේ සිට ඉටුකිරීමට නොහැකි වූ මෙම ව්‍යාපෘතියේ කාල සීමාව 2022 ජුලි මාසයේ සිට තව දුරටත් දීර්ඝ කිරීමට ආසියානු ඵලදායිතා සංවිධානයේ මහා මණ්ඩල රැස්වීම වෙත ඉදිරිපත් කරන ලදුව 2022.07.04 දිනැතිව ඒ සඳහා අනුමැතිය ලැබී ඇත. කෙසේ වෙතත් එම ව්‍යාපෘතිය සඳහා 2022 වර්ෂයේ | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට විදේශාධාර මුදල් වැයකල යුතුය |

| | |
|---|---|
| තිබුණි. අධාර මුදලින් මහියංගන මූලික රෝහලේ ව්‍යාපෘතියකට රු.2,091,854 ක් ද, තෙල්දෙණිය රෝහලේ ව්‍යාපෘතියකට රු.31,960 ක් ද වැය කර ඉතිරියෙන් රු.1,671,874 ක් වැය කර තායිලන්තය හා පාකිස්ථානයේ විදේශ පුහුණු සඳහා යාමට ගුවන් ටිකට්පත් මිලදී ගැනීමට වැයකර තිබූ අතර ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි | ලද ඇමෙරිකානු ඩොලර් 28000 ක මුදලින් වර්ෂය අවසාන ගිණුම් කටයුතු වලදී එවකට ක්‍රියාත්මකව පැවති මහියංගණ මූලික රෝහල ව්‍යාපෘතියට සහ තෙල්දෙණිය රෝහලේ ව්‍යාපෘතියට වැය කරන ලද අතර, ඉතිරි මුදලින් ගුවන් ටිකට් පත් මිලදී ගැනීම සඳහා වැය කර තිබුණි. කෙසේවෙතත් මෙම කාබනික පොහොර ව්‍යාපෘතියේ ඉතිරි ඇමෙරිකානු ඩොලර් 12000 ට ආසන්න මුදල සඳහා ක්‍රියාත්මක වැඩ අයිතමයන් සඳහා කටයුතු මේ වන විට සම්පූර්ණ කර ඇත. ඒ අනුව එම ඉතිරි මුදල ප්‍රතිපූරණය සඳහා බිල්පත් සකසා 2024/04/08 දිනැතිව ආසියානු ඵලදායිතා සංවිධානය වෙත යොමු කර ඇත. |

## 3.4 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් 2015 වර්ෂයේදී මූලික පිරිවැය රු.1,465,200 ක් දරා ප්‍රසම්පාදනය කරන ලද ebreeze පරිගණක පද්ධතියේ නඩත්තුව සඳහා 2023 වර්ෂය අවසාන වන විට රු.4,852,095 ක වැය දරා තිබුණි. ප්‍රධාන කාර්යාලයේ මානව සම්පත් කළමණාකරණය හා කෙටි පණිවුඩ සේවා සඳහා පද්ධතිය භාවිතයට ගෙන තිබූ අතර, දිවයින පුරා සේවය කරන ඵලදායිතා ලේකම් සංවර්ධන නිලධාරීන්ගේ පරිපාලනය, පුහුණුව, නිවාඩු කළමනාකරණය යනාදී වඩා ඵලදායී කටයුතුවලට නොයෙදවීම මත මෙම මෘදුකාංගය ඵලදායී ලෙස භාවිතා නොවීමෙන් මේ සඳහා යොදවන ලද මුදල ආර්ථික වශයෙන් ඵලදායී වී නොතිබුණි. | මේ වන විට ebreeze පද්ධතියේ නිවාඩු කළමනාකරණ කටයුතු සඳහා සම්පූර්ණයෙන්ම භාවිත කරනු ලබන අතර, ඊට අමතරව තැපැල කළමනාකරණය සඳහා මෙම වර්ෂයේ මැයි මස සිට භාවිත කරනු ලැබේ. ඊට අමතරව ගබඩා කළමනාකරණ කටයුතු සඳහා එම පද්ධතිය භාවිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. එසේම ebreeze පද්ධතිය ඇඟිලි සටහන් යන්ත්‍රය හා සම්බන්ධ කර මේ වනවිට අතින් (Manual) නිවාඩු සාරාංශ කිරීම වෙනුවට නිලධාරීන්ගේ නිවාඩු සාරාංශ වාර්තා පද්ධතිය හරහා ලබාගැනීමට කටයුතු කරමින් පවතී. ඉදිරියේදී දිවයින පුරා සිටින ඵලදායිතා සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රගතිය ලබා ගැනීමේ කටයුතු සඳහා යොදා ගැනීමට බලාපොරොත්තු වේ. | සම්පත් ඵලදායක ලෙස භාවිතා කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | එලදායීතා ලේකම් කාර්යාලය පවත්වාගෙන යනු ලබන සෙත්සිරිපාය දෙවන අදියර, 10 වන මහල පරිශ්‍රය සඳහා 2023 ජනවාරි සිට 2025 ජනවාරි දක්වා කාලපරිච්ඡේදයට බදුකුලී හා සේවා ගාස්තු සඳහා වර්ග අඩියක පිරිවැය සියයට 50 කින් ඉහල ගොස් තිබූ අතර, මේ සඳහා ආයතනය පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුම්ගතවී තිබුණි. 2023 වර්ෂයේ සිට මාසික බදු කුලිය රු.3,548,342 ක් වන අතර වාර්ෂික බදුකුලී වටිනාකම රු.30,578,901 ක් විය. ඉහත බදු මුදල් අවම කර ගැනීම සඳහා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු දෙපාර්තමේන්තුව සතු ඉඩකඩ තුලින් පරිශ්‍රයක් ලබාගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2024.04.30 දින අමාත්‍යාංශයේ ප්‍රධාන නිමැවුම් ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රගතිය විමසීමේ රැස්වීමේ දී කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ සිදු කළ යුතු අලුත්වැඩියා කටයුතු සිදු කිරීමෙන් අනතුරුව ජාතික එලදායිතා ලේකම් කාර්යාලය එම පරිශ්‍රයට රැගෙන යාම පිළිබඳව සාකච්ඡා කරන ලදී. | වැයබර අවම වන ආකාරයට කටයුතු කල යුතුය. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ වන්දි ලබාගැනීමේ අයදුම්පත්‍ර ඉදිරිපත් කල දිනය, අනතුරේ ස්වභාවය, කැඳවීම් කල දිනයන්, නඩු දින, වන්දි මුදල් තැන්පත් කිරීම් ආදී පරිපාලනමය තොරතුරු පරිගණක පද්ධතියකට ඇතුලත් නොවීම හේතුවෙන් තොරතුරු පරීක්ෂාව සඳහා ලිපිගොනු, ලේඛන භෞතිකව පරීක්ෂාවට ලක්කල යුතු වේ. මේ හේතුවෙන් ගොනුවල තොරතුරු කඩිනමින් ලබාගැනීම අපහසු මෙන්ම ගොනුවක් අස්ථානගතවීමෙන් තොරතුරු ලබාගත නොහැකි වීමේ අවධානමක්ද පවතී. | සියළුම වන්දි උසාවි වලට අදාලව වෙන වෙනම ලේඛණ යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි. | තොරතුරු පරිගණක ගතකර පරිපාලන කටයුතු පහසුකර ගැනීමට ක්‍රියාකල යුතුය. |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2005 අංක 10 දරන කම්කරු වන්දි සංශෝධන පනතෙහි iv වැනි කොටසේ 13(1) වගන්තිය ප්‍රකාරව වන්දි කොමසාරිස් වෙත තැන්පත් කරන ලද වන්දි මුදලක් ඒ සඳහා අයිතිය පවතින පුද්ගලයන් වෙත බෙදාදීමට කටයුතු කල යුතු වුවද 2023 දෙසැම්බර් 31 දිනය වන විට බෙදා නොහල පොදු තැන්පත් ගිණුමෙහි රඳවා තිබූ වන්දි මුදල රු.4,689,859 ක් විය. | වන්දි කොමසාරිස් වෙත තැන්පත් කරන ලද නමුත් මේ වනතෙක් බෙදා නොහළ පොදු තැන්පත් ගිණුමෙහි රඳවා තිබූ වන්දි මුදල රු.3,074,493 කි. මේ මුදල තුළ ගොනු 04 කට අදාලව තැන්පත් කළ මාස 06 ඉක්ම වූ රු.1,155,996 ක මුදලක් පවතියි. | අගතියට පත්වූ කම්කරුවන්ට හිමි ප්‍රතිලාභ කඩිනමින් ලබාදීමට කටයුතු කල යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ජාතික විගණන පනතේ 38 (ආ) සහ (ඊ) වගන්ති ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම ඉටුවන බවට සහතික කිරීම සඳහා එම පනතේ 40 වන වගන්තිය ප්‍රකාරව සිදුකර ඇති පත්කිරීම් හා මු.රෙ.133 හා 134 ප්‍රකාරව අභ්‍යන්තර විගණනයන් සිදුකල යුතු වුවද, 2023 වර්ෂයේදී අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පවතින ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය, ශ්‍රම වාසනා අරමුදල, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය යන ආයතනයන්හි විධිමත් අභ්‍යන්තර විගණන වැඩසටහන් ක්‍රියාත්මක කර තිබූ බවට නිරීක්ෂණය නොවීය. | පහත ආයතනවල අභ්‍යන්තර විගණනයන් 2023 වර්ෂය සඳහා පහත පරිදි සිදු කර ඇති බව.<br><br>ආයතනය — සිදු කරන ලද විගණන සංඛ්‍යාව<br>මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව — 13<br>ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය — 01<br>ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය — 02<br><br>එසේම 2023 වර්ෂයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්තු වාර්තා මගින් සහ විගණන හා කළමනාකරණ කමිටුව තුළ ද මෙම ආයතනයන්ගේ මූල්‍යමය හා ආයතනික කටයුතු අධීක්ෂණය සිදු කර ඇති බව.<br>කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රම වාසනා අරමුදලෙහි අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වී ඇති බැවින් 2023 වර්ෂයේ විගණනයන් | අභ්‍යන්තර විගණනය නියමිත පරිදි සිදුකල යුතුය. |

| | | |
|---|---|---|
| | සිදු කර නොමැත. එම පුරප්පාඩුව සපුරා ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතින බව. ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්තු වාර්තා මගින් සහ අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටුව තුළ ද ශ්‍රම වාසනා අරමුදලෙහි විගණන හා කළමනාකරණ කමිටුව තුළ ද මෙම ආයතනයේ මූල්‍යමය හා ආයතනික කටයුතු අධීක්ෂණය සිදු කර ඇති බව. | |

**5. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන අධිකරණ නිලධාරියකු වන අතිරේක කම්කරු වන්දි කොමසාරිස් තනතුර සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරක් වන සහකාර වන්දි කොමසාරිස් (පරිපාලන) තනතුර සඳහා අදාල නිලධාරීන්ගේ හිඟය 2015 වර්ෂයේ සිටම පැවතුණි. | කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ අධිකරණ නිලධාරී තනතුරු 03 ක් ඇත.එනම් කම්කරු වන්දි කොමසාරිස් /අතිරේක මහේස්ත්‍රාත්, අතිරේක කම්කරු වන්දි කොමසාරිස්/අතිරේක මහේස්ත්‍රාත් සහ නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස්/අතිරේක මහේස්ත්‍රාත් යන තනතුරු වේ.මෙම තනතුරුවල පත්වීම් බලධාරියා අධිකරණ සේවා කොමිෂන් සභාව වන අතර එම පත්කිරීම සම්බන්ධ තීන්දු තීරණ ගනු ලබන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාව මගිනි.<br>සහකාර කම්කරු වන්දි කොමසාරිස් (පරිපාලන) තනතුර ශ්‍රී ලංකා පරිපාලන සේවයට අදාල තනතුරක් වන අතර දීර්ඝ කාලයක සිට එම තනතුර සඳහා පත්කිරීමක් අදාල බලධාරීන් විසින් සිදු කර නොමැත. | නිලධාරීන් අනුයුක්ත කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |